**ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය - 2012**

01 මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2011 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් රු.3,346 ක ශේෂය මුදල් පොතේ සටහන් කිරීමේදී සිදුවූ අඩුපාඩුවක් සේ සලකා 2012 දෙසැම්බර් 31 දිනට මුදල් පොතෙහි ශේෂයට හා සමුච්චිත ඌණතා හා අතිරික්තතා ගිණුමට ගලපා තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් මුදල් පොතෙහි ශේෂය හා සමුච්චිත ඌණතා හා අතිරික්තතා ගිණුමෙහි ශේෂය අඩුවී තිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ කිහිපයක සිට අක්‍රීයව පැවැති රු. 7,642,763 ක වත්කම් ශේෂ 03 ක් හා රු. 437,324 ක බැරකම් ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | වාහන අළුත්වැඩියා | 727,724 | වාහන කාර්මික ශිල්පියකුගේ නිර්දේශය |
| (ආ) | අයිඑස්අයිඑෆ් ව්‍යාපෘතියේ නිලධාරී දීමනා | 3,979,926 | දීමනා විස්තර හා පත්වීම්/කාර්ය පැවැරුම් ලිපි |
| (ඇ) | මට්ටක්කුලිය ගොඩනැගිල්ලේ හා කොරිඩෝවේ අතිරේක වැඩ | 1,619,256 | අතිරේක වැඩ සඳහා අනුමැතිය |
| (ඈ) | ගෙවිය යුතු ශේෂ | 2,935,754 | උපලේඛන, ශේෂ තහවුරු කිරීම් හා කාල විශ්ලේෂණ |
| (ඉ) | සේවක ණය | 11,104,863 | එම - |
| (ඊ) | **මඩකලපුව ප්‍රාදේශීය විද්‍යාලයේ ඉදිකරන ලද ගොඩනැගිල්ල** | 1,078,400 | කළ වැඩ වාර්තා හා ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල තොරතුරු |
| | | 21,445,923 | |

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 104 | මෝටර් රථයකට වූ හානිය වෙනුවෙන් ප්‍රාරම්භක හා අවසාන වාර්තා පිළියෙල කිරීමට සහ එය ප්‍රතිපූරණය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ. 137(5) | අවස්ථා 02 ක දී භාණ්ඩ ලැබීමට පෙර රු. 3,029,994 ක් වූ මුළු මුදලම ගෙවා තිබුණි. |
| (iii) මු.රෙ. 396(ඈ) | නිකුත් කළ නමුත් මාස 06 ක් ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොවූ රු. 452,045 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් |

| | |
|---|---|
| | කටයුතු කර නොතිබුණි. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 1.3.2 මාර්ගෝපදේශය | මිල කැඳවීම් රහිතව අවස්ථා 03 ක දී එකතුව රු.3,362,405 ක භාණ්ඩ හා සේවා මිල දී ගෙන තිබුණි. |
| (ii) 3.2 මාර්ගෝපදේශය | අවස්ථා 02 ක දී රු 5,701,803 ක මිල දී ගැනීම් සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳැවීමක් සිදු කර නොතිබුණි. |
| (iii) 3.3 හා 3.5 මාර්ගෝපදේශය | සීමිත මිල කැඳවීම් යටතේ විභව සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවිය යුතු අතර සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට නම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගත යුතු ය. ඒ කිසිවකට අනුගත නොවී එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා රු. 2,049,994 ක නාවික සිතියම් හා පොත් මිල දී ගෙන තිබුණි. |
| (iv) 5.4.4 මාර්ගෝපදේශය | අවස්ථා 06 ක දී කිසිදු සුරක්ෂණයක් රහිතව මුළු වටිනාකමින් සියයට 25 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක එකතුව රු.3,563,962 ක් වූ අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (v) 5.6.1 මාර්ගෝපදේශය | අවස්ථා 06 ක දී පිරිවිතර නොදක්වා රු. 9,750,427 ක භාණ්ඩ මිල දී ගෙන තිබුණි. |
| (vi) 8.9.1 (ආ) මාර්ගෝපදේශය | 2012 වර්ෂය තුළ රු. 500,000 ඉක්මවන එකතුව රු.13,542,714 ක භාණ්ඩ මිල දී ගැනීමේ කොන්ත්‍රාත්තු 07 ක් සඳහා ගිවිසුම්ගත බැඳීමක් නොතිබුණි. |
| (vii) 8.13.3 මාර්ගෝපදේශය | විධිමත් අනුමැතියකින් තොරව ඇස්තමේන්තුගත මුදලින් සියයට 10 ක් ඉක්මවා සියයට 28 ක් හා සියයට 16 ක් වන පරිදි කර්මාන්ත 02 ක අමතර වැඩ සඳහා එකතුව රු. 2,364,590 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2011 දෙසැම්බර් 31 දිනැති අංක 6/2010 දරන රාජ්‍ය පරිපාලන | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව 2011 වර්ෂය තුළ දී නිලධාරීන් 14 |

| | |
|---|---|
| චක්‍රලේඛය | දෙනෙකු කොන්ත්‍රාත් හා කාර්ය පැවරුම් පදනම මත පත් කර 2012 ජූලි වන විට රු.4,270,183 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 42.51 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 31.85 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 10.66 ක පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීම කෙරෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. මිලියන 32.84 කින් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

3.1.1 කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මඩකලපුව ප්‍රාදේශීය විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ලබා දී තිබුණු රු. 20,000,000 ක ප්‍රතිපාදනවලින් 2012 අගෝස්තු මස වන විට රු. 1,078,400 ක් පමණක් වැය කර තිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 2.5 ඡේදයේ සඳහන් පරිදි ක්‍රියාකාරී සැලැසුමක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 මඩකලපුව ප්‍රාදේශීය විද්‍යාලයේ පාඨමාලාවකට සහභාගීවූවන්ට මසුන් බෝ කිරීමේ උපකරණ 56 ක් ලබා දීමට 2009 වර්ෂයේ දී රු. 547,000 ක් පෞද්ගලික ආයතනයකින් ලැබී තිබුණි. ඒ පිළිබඳ පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලාව අවසානයේ දී මිල දී නොගෙන ඊට වර්ෂ 03 කට පමණ පසු ඊට වැඩි මිලකට ඉහත උපකරණ 16 ක් මිල දී ගැනීම නිසා රු. 14,480 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) මසුන් බෝ කිරීමේ උපකරණ 40 ක් මිල දී නොගැනීම නිසා 2009 වර්ෂයේ සිට 2012 අගෝස්තු දක්වා රු. 412,520 ක් නිෂ්කාර්යව පැවැති අතර සිදු වූ කාල ප්‍රමාදය නිසා එම පාඨමාලාව හැදෑරූ සිසුන් ද වෙනත් රැකියා සඳහා යොමු වී තිබුණි. පසුව එම මුදලින් වෙනත් පුහුණු උපකරණ මිල දී ගෙන තිබුණ ද අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

3.1.3 ධීවර ජනතාවට අවශ්‍ය කරන විවිධ තොරතුරු ලබා ගැනීම සඳහා පරිගණකගත තොරතුරු සංනිවේදන ඒකකයක් ( Mobile Trading Portal Server ) නිර්මාණය කර ස්ථාපිත කිරීමට හා ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය හා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් රු. 6,282,320 (ඔස්ට්‍රේලියා ඩොලර් 60,500) ක් ඇස්තමේන්තු කර තිබුණි. විදේශ අරමුදලක් විසින් 2011 අගෝස්තු මස රු. 4,153,600 (ඔස්ට්‍රේලියා ඩොලර් 40,000) ක් ප්‍රදානය කර තිබුණු අතර ඉන් රු. 3,979,927 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා විදේශ අරමුදල විසින් ලබා දුන් මුදල හැර ඉතිරි රු. 2,128,720 (ඩොලර් 20,500) ක මුදල සපයා ගන්නා ආකාරය පිළිබඳ සැලැසුමක් නොතිබුණි.

(ආ) ප්‍රගති වාර්තාවලට අනුව එම සංනිවේදන ඒකකය නිර්මාණය කළ ද එය ස්ථාපිත කර ධීවර ජනතාවට අවශ්‍ය තොරතුරු ලබා දීමට 2012 දෙසැම්බර් වන විටත් හැකි වී නොතිබුණි. එබැවින් එම ව්‍යාපෘතියේ අරමුණ ඉටු වී නොතිබුණු අතර වැය කළ රු. 3,979,927 ක් අදාල ඒකකය ක්‍රියාකාරී වන තෙක් නිශ්ඵල වියදමක් වී තිබුණි.

3.1.4 2011 දෙසැම්බර් මස පැවැති තල්මසුන් හා ඩොල්ෆින් මත්ස්‍යයින් නැරඹීමේ ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය සඳහා රු. 328,239 ක් වැය කර තිබුණි. 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පැවැති මෙම ව්‍යාපෘතිය නැවතත් ආරම්භ කිරිමට උත්සවයක් පැවැත්වීම අනාර්ථික ගනුදෙනුවක් වූ අතර උත්සවයෙන් පසු දෙදිනක් සංචාරකයින් රැගෙන මුහුදු සංචාරය කළ ද, ඉන් පසු 2012 දෙසැම්බර් මස වන විටත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

| වර්ෂය | සිසුන් සංඛ්‍යාව |
|---|---|

3.1.5 පාඨමාලා පැවැත්වීම
----------------------

(අ) උපාධි පාඨමාලා පැවැත්වීම
------------------------------
උපාධි පාඨමාලා හදාරන ලද සිසුන් පිළිබඳ ප්‍රගතිය පහත පරිදි වේ.

| | 2012.01.01 දිනට සිටි | වර්ෂය තුළ බඳවා ගත් | අතර මඟ පාඨමාලාව හැර ගිය | වර්ෂය තුළ පාඨමාලාව සම්පූර්ණ කළ | 2012.12.31 දිනට සිටි |
|---|---|---|---|---|---|
| 2009 | - | 13 | 02 | - | 11 |
| 2010 | 11 | 32 | 05 | - | 38 |
| 2011 | 38 | 33 | 01 | - | 70 |
| 2012 | 70 | 18 | 04 | - | 84 |

| විද්‍යාලය | සිසුන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2012.01.01 දිනට සිටි | වර්ෂය තුළ බඳවා ගත් | අතර මග පාඨමාලාව හැර ගිය | වර්ෂය තුළ පාඨමාලාව සම්පූර්ණ කළ | 2012.12.31 දිනට පාඨමාලා හදාරමින් සිටි සංඛ්‍යාව |
| ත්‍රිකුණාමල | - | 95 | 15 | 80 | - |
| මීගමුව | 30 | 109 | 34 | 70 | 35 |
| මඩකලපුව | - | 103 | 22 | 67 | 14 |
| යාපනය | - | 161 | 07 | 140 | 14 |
| මට්ටක්කුලිය | 42 | 172 | 37 | 101 | 76 |
| කළුතර | 32 | 48 | 15 | 38 | 27 |
| ගාල්ල | 40 | 104 | 23 | 78 | 43 |

(ආ) ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම

ප්‍රාදේශීය විද්‍යාලවල 2012 වර්ෂය තුළ ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සඳහා සිසු සහභාගීත්වය පහත පරිදි විය.

| | | | | | |
|---|---|---|---|---|---|
| තංගල්ල | 45 | 231 | 93 | 82 | 101 |
| | ---- | ------ | ---- | ----- | ----- |
| | 189 | 1023 | 246 | 656 | 310 |
| | === | ==== | === | ==== | === |

(ඇ) උපාධි හැර අනෙකුත් පාඨමාලා පැවැත්වීම

-----------------------------------------------

2012 වර්ෂය තුළ දී උපාධි හැර අනෙකුත් පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| විද්‍යාලය | ඩිප්ලෝමා පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා | දින 10- 48 අතර පාඨමාලා | පරිගණක පාඨමාලා | ජංගම පාඨමාලා | එකතුව |
|---|---|---|---|---|---|---|
| ------------ | ---------- | ---------- | ----------- | -------- | -------- | ------- |
| ත්‍රිකුණාමල | 23 | 50 | 07 | | 205 | 285 |
| මීගමුව | 07 | 26 | 37 | | 299 | 369 |
| මඩකලපුව | - | 18 | 49 | | | 67 |
| යාපනය | - | 30 | 110 | | 25 | 165 |
| මට්ටක්කුලිය | 25 | 76 | - | | 39 | 140 |
| කළුතර | 11 | 27 | - | | - | 38 |
| ගාල්ල | 08 | 31 | 39 | | - | 78 |
| තංගල්ල | - | 43 | 10 | 29 | - | 82 |
| | ------- | ------ | ------ | ---- | ------ | ------ |
| | 74 | 301 | 252 | 29 | 568 | 1224 |

==== ==== ==== === ==== ====

(ප්‍රාදේශීය විද්‍යාලවලින් ලද තොරතුරු මත පිළියෙල කර ඇත)

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ධීවර හා නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ දැනුම වැඩි දියුණු කිරීම ආයතනයේ මූලික අරමුණ වුවත්, 2011 වර්ෂය තුළ තංගල්ල ප්‍රාදේශීය විද්‍යාලයේ සමස්ත සිසු සහභාගීත්වයෙන් සියයට 59 ක් පරිගණක ආශ්‍රිත පාඨමාලා හදාරා තිබුණි. 2012 වර්ෂයේ එය සියයට 35 දක්වා අඩුවී තිබුණි.

(ii) වර්ෂය තුළ අධ්‍යාපනය ලබමින් සිටි සිසුන් සංඛ්‍යාවෙන් සියයට 20 ක් අතරමග පාඨමාලාව හැර ගොස් තිබුණි.

(iii) වර්ෂය තුළ පුහුණු කළ සිසුන් 1224 දෙනෙකුගෙන් 568 දෙනෙකු එනම් සියයට 46 ක් එක් දින, දෙදින, හෝ පස් දින දැනුවත් කිරීමේ ජංගම වැඩසටහන්වලට සහභාගී වී තිබුණි. එවැනි වැඩසටහන් පැවැත්වීමෙන් පුහුණු ශ්‍රමිකයන් බිහි නොවන බැවින් ධීවර ක්ෂේත්‍රයට පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීමේ මූලික අරමුණ ඉටු වීමේ මන්දගාමී ස්වභාවයක් පැවැතිණි.

(iv) වෙනත් කිසිදු බාහිර කාර්යයක නියැළීමක් නොමැති ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ එකම හා මූලික කාර්යය පාඨමාලා පැවැත්වීම බැවින් යම් වර්ෂයක දී පාඨමාලා නිම කළ සිසුන් සංඛ්‍යාව එම වර්ෂය තුළ ආයතනයේ සමස්ත නිමවුම වේ. ඒ අනුව, 2012 වර්ෂය තුළ වැය කළ රු. 150,222,463 ක පුනරාවර්තන වියදම, සමස්ත නිමවුම වූ ජංගම පාඨමාලා හැර ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා නිම කළ සිසුන් සංඛ්‍යාව හා සැසඳූ විට වාර්ෂික ඒක ශිෂ්‍ය පිරිවැය රු. 228,998 ක් වී තිබුණි.

(v) උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා නිම කළ සිසුන්ගේ ප්‍රගතිය පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් ආයතනය සතුව නොතිබුණි.

(ඇ) පනතේ විධිවිධාන පරිදි කටයුතු නොකිරීම

----------------------------------------------

ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය ස්ථාපනය කළ 1996 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනතේ 3 වගන්තියේ සඳහන් කර්තව්‍යයන්ගෙන් පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් වූ (අ) හා (ආ) වගන්ති හැරුණු විට පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ දී ඉටු කර නොතිබුණි.

(i) ධීවර හා නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අධ්‍යයනය ගැන සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

(ii) ධීවර හා නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය සහ ව්‍යාප්ති පුහුණුව සම්බන්ධයෙන් පර්යේෂණ, සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීම.

(iii) දේශීය හෝ විදේශීය ආයතන සමඟ ගුරුවරුන් හා සිසුන් හුවමාරු කර ගැනීම.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු තංගල්ල නගරයේ වූ කඩ කාමරයක් 2011 ජුනි මස දී වර්ෂයක් සඳහා රු. 21,000 ක තැන්පතුවක් මත බදු දී තිබුණත් මාසිකව කුලී අය කරගෙන නොතිබුණි. 2012 ජුනි මස වන විට ගිවිසුම අවලංගු වී තිබුණත් එම දේපලෙහි භුක්තිය හෝ 2012 සැප්තැම්බර් මස දක්වා මසකට රු. 7,500 බැගින් වූ එකතුව රු. 105,000 ක හිඟහිටි කුලී ද අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) තංගල්ල විද්‍යාලයේ භාවිතය සඳහා අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ විශාල යාත්‍රා 02 ක් සහ කුඩා බෝට්ටු 02 ක් තිබුණි. ඒ සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අනතුරට පත් ධීවර යාත්‍රා බේරාගැනීමෙන් 2011 වර්ෂයේ දී රු. 714,565 ක ආදායමක් ලැබුණ ද, 2012 වර්ෂයේ දී එමගින් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. ප්‍රදේශවාසීන්ට ද සේවාවක් සැලසිය හැකි එම කාර්යය උදෙසා පවතින යාත්‍රා අළුත්වැඩියා කර යෙදවීමට ආයතනය අවධානය යොමු කර නොතිබුණි.

(ii) එක් යාත්‍රාවක ලොග් සටහන් පොත හා ඉන්ධන ලේඛණය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. යාත්‍රාපති නිවාඩු යෑම හේතුවෙන් එම යාත්‍රාව භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් කිරීමටද, එම නිලධාරියාගේ වැඩ බැලීම සඳහා පත් කළ නිලධාරියා පිළිබඳ පැහැදිලි කිරීමට ද යාත්‍රා අංශ ප්‍රධානී අපොහොසත් විය.

(iii) සිසුන්ගේ පුහුණු වීම් සඳහා කළ මුහුදු ගමන් පිළිබඳ තොරතුරු පුහුණු අංශය විසින් පවත්වා නොගැනීම හේතුවෙන් ඒවායේ නිවැරදිතාව තහවුරු කළ නොහැකි විය.

(ඈ) ගණකාධිකාරීවරයෙකු ඇතුළු කාර්ය මණ්ඩලයක් සිටිය දී එම කටයුතු සඳහා රජයේ විශ්‍රාමික නිලධාරියෙකු හා බැංකු සැසඳුම් පිළියෙල කිරීමට නිලධාරිනියක්ද බඳවා ගෙන එකතුව රු. 239,000 ක් ගෙවීම් කර තිබුණි. බැංකු සැසඳුම් නිවැරදි නොවීම නිසා ඒවා නැවත සැකසීමට පෞද්ගලික විගණන ආයතනයකට භාර දී තිබුණි.

(ඇ) වර්ෂ කිහිපයක් පැරණි රු. 309,441 ක ලැබිය යුතු ශේෂ 05 ක් ආදායම් වියදම් ගිණුමට ලියා හැර තිබුණ ද, ඒ සඳහා කිසිදු අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ඉ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කාර්ය පැවැරුම් පදනම මත වූ පත්වීම් දින 45 ක් නොඉක්මවන හා හදිසි සේවාවන් සඳහා පමණක් සීමා විය යුතු වුවත්, ඊට පටහැනිව හදිසි සේවාවන් නොවූ ආයතනයේ සාමාන්‍ය කටයුතු සඳහා නිලධාරීන් 08 දෙනෙකු 2011 වර්ෂයේ දී පත් කර 2012 ජූලි වන විට රු. 3,192,099 ක් ගෙවා තිබුණි. මේ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියක් ද නොතිබුණි. එමෙන්ම, නියමිත කාලයක් සඳහා නිශ්චිත කාර්ය පැවරුමක් ලබා දී නොතිබුණු අතර අදාල කාලය තුළ ඉටු කළ කාර්ය ද පැහැදිලිව හඳුනා ගත නොහැකි විය. තව ද, කාර්ය පැවැරුමකට ගෙවිය හැකි රු. 30,000 ක දීමනාව වෙනුවට මසකට රු. 50,000 ක් හා රු. 35,000 යනා දී ලෙස ගෙවීම් කර තිබුණි.

3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙරළ ක්‍රීඩා උළෙල පැවැත්වූ තංගල්ල පරෙයිවැල්ල වෙරළට කිරින්ද ධීවර වරායේ සිට මුහුදු වැලි ප්‍රවාහනය වෙනුවෙන් රු. 69,000 ක් ගෙවා තිබුණි. මුහුදු වැලි බහුලව පවතින වෙරළබඩ ස්ථානයකට මුදල් ගෙවා මුහුදු වැලි ගෙන ඒම ගැටළු සහගත විය.

(ආ) ආයතනයේ අභ්‍යන්තර මාර්ගය අඩි 450 ක් දිගට කොන්ක්‍රීට් කිරීම කඩිනම් කිරීම සඳහා ඍජු ශ්‍රමය මගින් කළ යුතු යැයි කාර්ය පැවැරුම් මත බඳවා ගත් ඉංජිනේරුවරයාගේ යෝජනාවකට අනුව, රු. 193,800 ක ද්‍රව්‍ය යොදා 2012 පෙබරවාරි වන විට අඩි 166 ක් ඉදි කර තිබුණි. ඉතා හදිසි වූ මෙම කර්මාන්තයේ ඉතිරි අඩි 284 ක වැඩ කොටස් 2012 අගෝස්තු වන විටත් ඉටු කර නොතිබුණු අතර අදාළ ඉංජිනේරුවරයා ආයතනයේ සේවයෙන් ද ඉවත්ව ගොස් තිබුණි.

(ඇ) මඩකලපුව ප්‍රාදේශීය විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම අධීක්ෂණය සම්බන්ධයෙන්, 2009 ජූනි මස සිට 2012 අගෝස්තු මස දක්වා නිලධාරියෙකුට රු. 200,000 ක දීමනා ගෙවා තිබුණ ද අදාල ගිවිසුමෙහි ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

3.4 අරමුණුවලින් බැහැර ගනුදෙනු
----------------------------------

අභ්‍යාසලාභීන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින්, ඉන්ධන සඳහා රු. 225,000 ක් වැය කර 2012 අප්‍රේල් මස සහකාර අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක් ආයතනය සතු යාත්‍රාවක පවත්වා තිබුණි.

3.5 ඌන උපයෝජිත වත්කම්
---------------------------

2010 වර්ෂයේ සිට 2012 සැප්තැම්බර් මස දක්වා කඩ කාමර දෙකක් වසා දමා තිබුණු අතර 2010 දෙසැම්බර් 29 දිනැති තක්සේරු වාර්තාව අනුව ඒවායේ කුලී වටිනාකම පිළිවෙලින් රු. 7,000 ක් හා රු. 7,500 ක් විය.

3.6 හඳුනාගන්නා ලද පාඩු
------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ දී තංගල්ල විද්‍යාලයේ ආරම්භ කළ ධීවර හා නාවික විද්‍යා උපාධි පාඨමාලාව සඳහා 2012 සැප්තැම්බර් මස වන විට හිඟහිටි පාඨමාලා ගාස්තුව රු. 2,743,000 ක් විය.

(ආ) ජාතික ධීවර සංස්ථාවට බඳු දී තිබුණු තංගල්ල නගරයේ පිහිටි කඩ කාමර දෙකක් සඳහා කිසිදු බදු ආදායමක් 1991 වර්ෂයේ සිට 2012 සැප්තැම්බර් මස දක්වා ලැබී නොතිබුණි.

(ඇ) බසයක් මිල දී ගැනීම සඳහා ලැබූ මිල ගණන් අනුව, රු. 3,000,000 කට ආසන 42 ක ටාටා බස් රථයක් මිලදී ගැනීම සාපේක්ෂව වාසිදායක වුවත්, ආසන 38 ක එම වර්ගයේම බස් රථයක් රු.3,250,000 කට මිල දී ගෙන තිබුණි.

(ඈ) මිල ගණන්වල වලංගු කාලපරිච්ඡේදය අවසාන වී දින 46 කින් භාණ්ඩ ඇනවුම් කළ ද එයට අදාල සැපයුම්කරු එකඟ නොවීම නිසා නැවත මිල කැඳවීමකින් තොරව එම සැපයුම්කරු පසුව දිරිපත් කළ වැඩි මිලට පරිගණක 80 ක් මිල දී ගැනීම නිසා රු.256,000 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

(ඉ) ආයතනික පිරිවිතර නිර්ණය කිරීමකින් හා භාණ්ඩවල නිදර්ශක පරීක්ෂා කිරීමකින් තොරව එකම ආයතනයකින් රු.2,451,803 ක් වැය කර කාර්යාලීය උපකරණ මිල දී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව කළ නිර්දේශය විගණනයේ දී ගැටළුසහගත වූ අතර අවම මිල නොසැලකීම නිසා භාණ්ඩ වර්ග 07 ක් වෙනුවෙන් රු. 278,375 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාලය අළුත්වැඩියාවේ දී රු. 150,000 ක වැඩ විෂයයක් කොන්ත්‍රාත්කරු පැහැර හැර තිබුණි. කාර්යසාධන ඇපකරය අවලංගු වීමට පෙර එම කාර්ය ඉටු කර ගැනීම හෝ ඊට එරෙහිව නීතිමය පියවර ගැනීම වෙනුවට වෙනත් ආයතනයකින් එම කාර්ය ඉටු කර ගැනීම නිසා රු.87,856 ක පාඩුවක් සිදු වී තිබුණි. එමෙන්ම, කළ වැඩවල නිවැරදිතාව පිළිබඳ තහවුරුවක් වෘත්තීය නිපුණතාවකින් යුතු පුද්ගලයෙකුගෙන් ලබා ගැනීම වෙනුවට පුස්තකාලයාධිකාරීගෙන් ලබා ගෙන තිබුණි.

(ආ) මට්ටක්කුලිය ප්‍රධාන ගොඩනැගිල්ල හා කොරිඩෝව නවීකරණය සඳහා රු. 5,813,532 ක ලංසුවකට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදනය පිරිනමා තිබුණු ආයතනය අවම මිල ඉදිරිපත් කර තිබුණු නමුත් පුවත්පත් දැන්වීම පරිදි, ප්‍රමාණවත් වලංගු කාල පරිච්ඡේදයක් සඳහා ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.8 හි (ඇ) මාර්ගෝපදේශය පරිදි, ඉදිරිපත් කර ඇති ලංසුවේ කාල සීමාව, නියම කර ඇති කාල සීමාවට වඩා අඩු නම් එය ප්‍රතික්ෂේප කළ යුතු වුවත්, ඊට පටහැනිව වලංගු කාලය දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඒ අනුව ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

(ii) ආයතනය විසින් 2012 ජනවාරි 26 දින කොන්ත්‍රාත්කරු සමඟ එළැඹ තිබුණු ගිවිසුමේ 04 වැනි ඡේදයට අනුව, 2012 ජූලි 23 දිනට පෙර අදාල කාර්යය අවසන් කළ යුතු වුවත්, දින 45 ක කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා තිබුණි. ඒ සඳහා දින 90 ක දින දීර්ඝ කිරීමක් ලබා දී තිබුණ ද, එම කාලය ද ඉක්මවා 2012 දෙසැම්බර් මස 12 දින වැඩ නිම කර තිබුණි. ප්‍රමාද කාලය සඳහා ගාස්තු අය කිරීම් සම්බන්ධ කොන්දේසි කිසිවක් ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(iii) ඇස්තමේන්තුගත පිරිවැය වූ රු. 5,813,532 කින් රු. 2,089,413 ක් ලෙස එනම් සියයට 36 ක වැඩ ඉටුකර නොතිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාලයේ උද්‍යාන අලංකරණය සඳහා වූ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් දී තිබුණු කාර්යසාධන ඇපකරය 2013 පෙබරවාරි මස වන විට අවසන්ව තිබුණි. ගිවිසුම පරිදි 2012 නොවැම්බර් මස අවසන් කළ යුතු එම කාර්යය 2013 අප්‍රේල් මස දක්වා අවසන් වී නොතිබුණි. ප්‍රමාද කාලය සඳහා ගාස්තු අය කිරීම් සම්බන්ධ කොන්දේසි කිසිවක් ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ත්‍රිකුණාමලය යාත්‍රාවේ අළුත්වැඩියාවන් 2013 පෙබරවාරි මස නිම කළ යුතු වුවත්, 2013 සැප්තැම්බර් මස වන විටත් එම කාර්යයන් නිම කර නොතිබුණි.

(ඉ) තංගල්ල ප්‍රාදේශීය විද්‍යාල ආපන ශාලා භාරකරු වෙත 2011 ජුනි මස සිට 2012 සැප්තැම්බර් මස දක්වා ආහාර ගත් සිසුන් ගණන මත රු. 589,325 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්තුව භාර දීමට පෙර මිල ගණන් කැඳවා නොතිබුණි.

(ii) ලිඛිත ගිවිසුමක් නොතිබුණු අතර සැපයුම්කරු ලබා දෙන ආහාරවල ස්වභාවය හා මිල ගණන් පිළිබඳව හෝ ලිඛිත එකඟතාවකට එළඹී නොතිබුණි.

(iii) ආහාර ගත් සිසුන් සංඛ්‍යාවේ නිවැරදිතාව පරීක්ෂා කර නොතිබුණි.

3.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්

---------------------------------------------------------------

තංගල්ල විපුල මන්දිර පරිශ්‍රයේ පිහිටි වර්ග අඩි 2231 ක ගොඩනැගිල්ල ජනාධිපති ආරක්ෂක අංශය විසින් වර්ෂ කිහිපයක සිට ප්‍රයෝජනයට ගනිමින් පැවැතිය ද, ඒ වෙනුවෙන් කිසිදු කුළියක් අය කර නොතිබුණි.

3.9 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන උසස් අධ්‍යයන ප්‍රධානී හා ජ්‍යෙෂ්ඨ තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරු සඳහා තිදෙනෙකු බඳවා ගෙන 2012 ජූලි මස වන විට රු. 1,978,118 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් සිට ආයතනයේ ලිපිකාරිණියක් වෙනත් රජයේ ආයතනයකට අනුයුක්ත කර තිබුණ ද, 2012 සැප්තැම්බර් දක්වා ඇයගේ වැටුප ආයතනයෙන් ගෙවා තිබුණි.

(ඇ) 272 දෙනෙකුගෙන් සමන්විත අනුමත කාර්ය මණ්ඩලයෙන් 115 දෙනෙකු සඳහා පුරප්පාඩු පැවැති අතර ඒ තුළ උසස් අධ්‍යාපන, පුහුණු, පාලන හා මුදල් යන අධ්‍යක්ෂ තනතුරු ද විය.

(ඈ) 2011 ඔක්තෝබර් සිට පුරප්පාඩු වූ අධ්‍යක්ෂ (පුහුණු) තනතුරේ වැඩ බැලීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පත් කර තිබුණි. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 උප වගන්තිය අනුව වැඩ බැලීමේ පත්වීමක් යනු නිත්‍ය පත්වීමක් කරන තෙක් වූ තාවකාලික ප්‍රතිකර්මයක් වුවත්, 2013 අප්‍රේල් මස වන විට වැඩ බැලීමේ පත්වීම සිදු කර වර්ෂ 1 ½ ක් ගත වී තිබුණි. එමෙන්ම, පත්වීම් දින සිට 2013 අප්‍රේල් දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස එකතුව රු. 167,605 ක් ගෙවා තිබුණ ද, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2.6 උපවගන්තිය පරිදි අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඉ) කථිකාචාර්ය හා විද්‍යාල උපදේශක තනතුරුවලින් 27 ක් එනම්, සියයට 47 ක් පුරප්පාඩුව පැවතුණි.

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු අංක ඩීඑම්එස්/ඊ4/50/7/298/1(Vol 1) දරන ලිපිය පරිදි තාක්ෂණික නිලධාරී තනතුර අනුමත තනතුරුවලින් ඉවත් කර තිබුණු අතර ඒ වන විට එම තනතුර දරන්නාගේ සේවය අවසන්වීමත් සමඟම එම තනතුර අහෝසි වී තිබුණි. ඒ අනුව, එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබුණු නිලධාරියාගේ හය මාසික සේවා කාලය 2012 අප්‍රේල් 07 දින අවසන් විය යුතු වුවත්, 2013 අප්‍රේල් 26 විගණන පරීක්ෂණ දින වන විටත් මාස හයෙන් හයට එම තනතුර දරන නිලධාරියාගේ සේවා කාලය දීර්ඝ කරමින් පැවතුණි. මේ අනුව අනුමත නොවූ තනතුරක් වෙනුවෙන් 2012 අප්‍රේල් මස සිට 2013 අප්‍රේල් මාසය දක්වා එකතුව රු. 390,000 ක් ගෙවීමට ආයතනය පියවර ගෙන තිබුණි.

(උ) භාණ්ඩාගාරයේ හා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියක් රහිතව 2011 මැයි මස යාත්‍රා උපදේශක තනතුර සඳහා නිලධාරියෙකු පත් කර වැඩ කරන දිනකට රු. 3,750 ක් වන පරිදි 2013 මාර්තු මාසය දක්වා එකතුව රු. 833,203 ක දීමනා ගෙවා තිබුණි.

3.10 වාහන පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලොරි රථයක් සඳහා ස්ටාටර් මෝටරයක් නොයෙදීම නිසා 2012 ඔක්තෝබර් විගණන පරීක්ෂණ දින වන විටත් එම රථය තංගල්ල , විපුල මන්දිර භූමියේ ආවරණයක් ද රහිතව දිරාපත් වෙමින් පැවැතිණි. ඉහත අළුත්වැඩියාව හැර මෙම රථය ධාවනයෙන් ඉවත් කිරීමට හේතු වූ කරුණු මෙන්ම, එය ධාවනයෙන් ඉවත් කළ දිනය හා දෛනික ධාවන සටහන් කිසිවක් ද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තව ද, ස්ටාටර් මෝටරයක් යෙදීම වැනි සුළු අළුත්වැඩියාවක් ඉටු නොකර එය දිරාපත් වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමට ද ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) ඩිපෝ ඉංජිනේරුවරයෙකු විසින් ආයතනය සතු බස් රථයක අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් නිකුත් කළ වාර්තාව පරිදි කටයුතු නොකිරීම නිසා 2008 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර ආවරණයක් ද රහිතව 2012 සැප්තැම්බර් මස වන විටත් තංගල්ල ප්‍රාදේශීය විද්‍යාල භූමියේ දිරාපත් වෙමින් පැවැතිණි. එමෙන්ම, එය අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බව ඩිපෝ ඉංජිනේරුවරයෙකු විසින් 2012 සැප්තැම්බර් 13 දිනැතිව ලබා දී තිබුණු වාර්තාව අනුව

තහවුරු විය. අවශ්‍ය අළුත්වැඩියා ඉටු නොකර එය දිරාපත් වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණු අතර තංගල්ල විද්‍යාලයේ එන්ජින් පුහුණු පාඨමාලාව සඳහා මෙම රථය ලබා දෙන ලෙස කළ ඉල්ලීම ද ඉටු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 04 කට පමණ පෙර අස්ථාන ගත වූ යතුරු පැදියක් සම්බන්ධයෙන් ආයතනය කිසිදු පියවරක් ගෙන නොතිබුණු අතර විගණන විමසීම් හේතුවෙන්ම පත් කළ විමර්ශන කමිටුවේ වාර්තාව 2013 ජනවාරි මස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ ද අවශ්‍ය පියවර ගැනීමට 2013 ඔක්තෝබර් මස වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) දිරාපත් වූ වාහන 04 ක් සහ සුනාමි ව්‍යවසනයෙන් විනාශ වූ වාහන 03 ක් අපහරණය කර නොතිබුණි.

(ඉ) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් පරිත්‍යාග කළ වාහන 05 ක හා ධීවර අමාත්‍යාංශයෙන් ලද වාහනයක හිමිකාරත්වය ආයතනයට පවරා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 සංයුක්ත සැලැස්ම
---------------------

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2012-2014 කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන්හි මූල්‍යමය අගයන් දක්වා වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි වන සේ සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම
---------------------

සැලැසුම්ගත කාල පරිච්ඡේදය තුළ ලඟා විය යුතු අරමුණු හා ඉලක්ක සමඟින් කළමනාකරණයේ වගකීම් පැහැදිලිව හඳුනාගත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුව ද, මූලධන වියදම් සම්බන්ධ සැලැස්මක් පමණක් සකස් කර තිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමත කර ගෙන නොතිබුණි.

4.4 අයවැය පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය අනුව මුදල් වර්ෂය අවසන් වන දිනට අයවැයගත ශේෂ පත්‍රය, ආදායම් හා වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 මැයි 04 දින අනුමත කර තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය
(ආ) අයවැය පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය